# සිංහල බෞද්ධ සංස්කෘතියෙහි පරාජය

පෘතුගීසීන් පැමිණීමට පෙර මෙරට සංස්කෘතිය පරමාදර්ශී වී යැයි අපි නො කියමු. එහෙත් එහි අදට වඩා මිනිසුන්ට විවෙකයක් තිබු බව පැහැදිලි ය. මෙරට ප්‍රධාන සංස්කෘතිය, අවශ්‍ය නම් අධිපතිවාදී සංස්කෘතිය, සිංහල බෞද්ධ සංස්කෘතිය විය. එහෙත් එයින් අදහස්කරන්නේ මෙරට අනෙක් සංස්කෘතීන්ට තැනක් නොතිබු බව නො වේ. ඒ ඒ සංස්කෘතීන්ට මෙරට තිබු තැන පෙනී යන්නේ පෘතුගීසීන්ගේ අතවරයට ලක් වූ මුස්ලිමුන් වත්මන් නැගෙනහිර පළාතේ මුහුදුබඩ තීරයේ පදිංචිකිරීමට සෙනරත් රජු  පියවරගැනීම හා ලන්දේසීන්ගෙන් අතවරවලට භාජනය වූ කතෝලිකයන් මාතලේ වහකෝට්ටේ වැනි ප්‍රදේශවල පදිංචිකිරීමට සිංහල රජුන් විසින් පියවර ගනු ලැබීම ආදිය මගිනි. ඒවා හුදෙක් ඡන්දය දිනාගැනීමට හෝ ජනතාව රැවටීමට ගනු ලැබූ පියවර නො වී ය.

සිංහල බෞද්ධ සංස්කෘතිය නිවන වටා ගොඩනැගිණි. සිංහල බෞද්ධයාගේ පරම අභිලාෂය වූයේ නිවන් අවබෝධකිරීම ය. එය ලෝකොත්තර පරමාදර්ශය විය. මෙහි දී පරමාදර්ශය යන වචනය යෙදෙන්නේ ලෞකික අර්ථයකින් බව පැහැදිලි විය යුතු ය. නිවන යනුවෙන් දෙයක් හෝ තැනක් හෝ නැත. නිවන පරමාදර්ශය යැයි කීම පවා වැරදි ය. එහෙත් අපි නිවන සම්බන්ධයෙන් එවැනි වචන යොදාගන්නෙමු. එසේ නොවන්නට අපට නිවන ගැන කතාකිරීමට පවා නොහැකි බනු ඇත.

ගෞතම බුදුන් වහන්සේගේ  ශාසනයෙහි බැරිනම් වැඩිකල් නොගොස් මෛත්‍රීය බුදුරජාණන් වහ්සේගේ භාසනයෙම නිවන් දැකීමට සිංහල බෞද්ධයෝ බලාපොරොත්තු වෙති. ඇතැමුන් එය වැරදියට අර්ථවිවරණය කර සිංහල බෞද්ධයන් නොමග යැවීමට කටයුතු කරනු පෙනෙන්නට ඇත. සිංහල බෞද්ධයන් කිසි දිනෙක ගෞතම බුදුන් වහන්සේගේ සසුනෙහි නිවන් අවබෝධකරගැනීම කල නොහැකි වුවක් සේ සලකා එය මෛත්‍රී බුදුන් වහන්සේගේ සසුනෙහි දී කරගැනීමක් දක්වා කල්දමා තිබුනේ නැත. මෛත්‍රී බුදුන් වහන්සේගේ සසුනෙහි නිවන් දැකීමට සිංහල බෞද්ධයන් අපේක්ෂා කෙළේ අඩුම තරමින් ඒ සසුනෙහි හෝ නිවන් දැකීමට මිස නිවන් අවබෝධකරගැනීමේ ප්‍රයත්නය කල් දැමීමට නො වෙයි.

එහෙත් අද ඇතැමුන් සිංහල බෞද්ධයන් ගෞතම බුදුන් වහන්සේගේ  බුද්ධ ශාසනයෙහි ම නිවන් දැක්කවීමට කටයුතු කරනු පෙනෙන්නට ඇත. හැකි නම් අද වුව ද නිවන් අවබෝධකරගැනීම යහපත් ය. එහෙත් සියල්ලන්ට එසේ කිරීමට නො හැකි ය. ඒ බව සිංහල බෞද්ධයෝ දනිති. ගෞතම බුදුන් වහන්සේ වැඩසිටි කාලයෙහි පවා ඔගධ දේශයෙහි ජීවත්වූවන්ගෙන් කී දෙනෙක් නිවන් අවබෝධ කළෝ ද? අද ඇතැමුන් බුදුන් වහන්සේ ද ඉක්මවා ගොස් සියල්ලන් කෙසේ වෙතත් තොග පිටින් නිවන් දැක්කවීමට කතාකරන්නේ හුදු ජනප්‍රිය රැල්ලක් ඇතිකිරීමට බව පැහැදිලි ය. එලෙස ජනප්‍රිය රැලි ඇතිකර නිවන් දැකීම විලාසිතාවක් බවට පත්කරන්නේ සිංහල බෞද්ධයනට නිවන් දැක්කවීමට නොව නිවනට කෙසේ වෙතත් ඔවුන් වෙනත් තැනකට දැක්කවීමට ය.

එවැනි ජනප්‍රිය රැලි නිර්මාණය පසෙකට දැමුවිට සිංහල බෞද්ධයන් කටයුතුකර ඇත්තේ මේ සසුනෙහි බැරිනම් අඩුම තරමින් මෛත්‍රී බුදුන් වහන්සේගේ සසුනෙහි නිවන් අවබෝධ කරගැනීමට ය. එහෙත් ඒ කලින් සඳහන්කර ඇති ආකාරයට ලෝකෝත්තර ව ය. ලෞකික ව ගත්කල ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ කුමක් ද? වෙනත් වචනවලින් කියන්නේ නම් ඔවුන් තම ලෞකික ජීවිත සකස්කර ගත්තේ කෙසේ ද?

සිංහල බෞද්ධ උපාසක උපාසිකාවන්ගේ මුවින් පිටවන වචන අතර අනේ අනිච්චං, නිවිහැනහිල්ලෙ ඉන්නවා ආදිය ද වෙයි. සිංහල බෞද්ධයෝ නිවන් අවබෝධකරගන්නා තෙක් නිවිහැනහිල්ලේ ජීවත්වීමට බලාපොරෙත්තු වෙති. ඇතැම් විට ඔවුහු කිසි නිවනක් නෑ ආදී ප්‍රකාශ ද කරති. සිදුහත් කුමරු නිබ්බුත පද ඇසීමේ සිද්ධිය ද මෙහි දී අපේ අවධානයට යොමු විය යුතු ය. නිවුනු මවක, නිවුනු පියකු, නිවුනු බිරිඳක ආදී ප්‍රකාශවල නිවිහැනහිල්ලෙ ජීවත්වන්නේය යන අරුත ඒ ආකාරයෙන් ම නැති වුව ද ඉතා සමීප ආකාරයකින් වෙයි.

© Prof. Nalin De Silva

අනෙක් අතට සිංහල බෞද්ධයන්ගේ ජීවිත සකස් වී ඇත්තේ අනිත්‍යය මෙනෙහි කිරීම පෙරදැරි කරගෙන ය. අනේ අනිච්චං යනුවෙන් කියන උපාසිකාව කරන්නේ ලොවෙහි අනිත්‍ය බව මෙනෙහි කිරීම ය. අනිත්‍ය වූ ලෝකයක අප ජීවත්වන්නේ කෙසේ ද යන ප්‍රශ්නය සිංහල බෞද්ධයන්ගේ ජීවිත සකස්කිරීමේ දී බලපා ඇති බව පැහැදිලි ය. එවැනි සමාජයක තම තමන්ගේ ඉන්ද්‍රිය පිනවීම ජීවිතයේ එකම බලාපොරොත්තුව බවට පත් නොවන බව පැහැදිලි ය.

පන්සිල් යනු බුදුන් වහන්සේට පෙර සිටම භාරතයේ පැවති ශීලයකි. එසේ වුවත් පන්සිල් ජීවන රටාවක් බවට පත්වී ඇත්තේ බෞද්ධයන් අතර යැයි කීම නිවැරදි ය. සිංහල බෞද්ධ සමාජය පන්සිල් රැකි සමාජයක් විය. මෙරට සමාජයෙහි දුසිරිත යන්න අර්ථදැක්වුණේ පන්සිල්වලට සාපේක්ෂව ය. පන්සිල් නොරැකීම දුසිරිත ය විය. ඒ ඒ සමාජයෙහි දුසිරිත අර්ථ දැක්වෙන්නේ ඒ ඒ සමාජයට සාපේක්ෂව ය. බටහිර රටවල පන්සිල් රැකීම යන්න සුචරිතයක් නො වෙයි. එහි සුචරිතය පන්සිල් කැඩීම හා සම්බන්ධ වෙයි.

බටහිර රටවල පන්සිල් රැකීමක් අපේක්ෂා නො කෙරෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇත්තේ ඉන්ද්‍රිය පිනවීම ය. ඒ සමාජයෙහි අනෙක් පුද්ගලයකුගේ නිදහසට  අවහිරයක් නොවන තාක් තම ඉන්ද්‍රිය පිනවීමේ වරදක් නැත.මෙහි දී අවධාරණය කළ යුතු කරුණ නම් අනෙක් පුද්ගලයකු ගැන මිස අනෙක් සතකු ගැන හෝ පරිසරය ගැන හෝ සදහනක් නො වීම ය. අනෙකා පරයා යෑම ප්‍රතිපත්තිය කරගත් සමාජයක මුළු මහත් ලෝකයම නොව විශ්වයම මවා (හෝ මැවී හෝ) ඇත්තේ මිනිසා වෙනුවෙන් යැයි කියන සමාජයක ඇත්තේ තරගයක් පමණකි. ඒ ඊනියා දියුණුව හඹායන තරගයකි.

දියුණුව යන්න වුව ද ඒ ඒ සමාජයෙහි අර්ථදැක්වෙන්නේ ඒ ඒ ආකාරයෙන් ය. සිංහල බෞද්ධ සමාජයෙහි දියුණු පුද්ගලයා නිවනට සමීප වූවෙකි. මෙහි දී නැවතත් අවධාරණය කළ යුත්තේ නිවනට සමීපය වැනි ව්‍යවහාර නිවැරදි නොවන බව ය. සමීප වීමට නිවන යනුවෙන් තැනක් නැත. එසේ වුවත් පුද්ගලයකුගේ මමත්වය තුනීවන තරමට ඒ පුද්ගලයා නිවනට සමීප යැයි අපට කිවහැකි ය. එවැනි පුද්ගලයෙකු බොහෝ විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දියුණු නො වූවෙකි.

පුද්ගලයකු ලෙස පමණක් නොව සමාජයක් ලෙස ගත්ත ද දියුණුව සම්බන්ධයෙන් එවැනි වෙනස්කම් ඒ ඒ සමාජ අතර වෙයි. අද ඇමරිකා එක්සත් ජනපද හා අනෙක් බටහිර රටවල් දියුණු ලෙස සැලකෙයි. බටහිර මිම්මෙන් ලංකාව නොදියුණු රටකි. අද අවාසනාවකට ලෝකයට ම ඇත්තේ එක් මිනුම් දණ්ඩකි. ඒ මිනුම් දණ්ඩ යොදාගැනීමට සිදුවීම මගින් ද කියැවෙන්නේ ලෝක ආධිපත්‍යය ඇත්තේ කාහට ද යන්න ය. අපි දියුණු වීමට යැයි කියමින් ලංකාව තවත් ඇමරිකාවක් හෝ සිංගප්පූරුවක් හෝ කිරීමට මහන්සි වෙමු. ලංකාව ලංකාවක් බවට පත්කිරීමට අවශ්‍ය වී ඇත්තේ ඉතා සුළු පිරිසකට පමණ ය. ඔවුන්ට බටහිර දියුණුව යන්න අළුයම ලූ කෙළ පිඬක් බඳු ය.

අප කතාකරමින් සිටියේ දුසිරිත හා සුසිරිත පිළිබඳ ව මිස දියුණුව ගැන නො වෙයි. එහෙත් සුසිරිත දියුණුව සමග ද බැඳී ඇත. එබැවින් සුසිරිත පිළිබඳ සාකච්ඡාවක දියුණුව යන්න ද යම් ප්‍රමාණයකින් හෝ අඩංගු වෙයි. පෘතුගීසීන් පැමිණීමෙන් පසු අපි වෙනස්වීමට පටන්ගතිමු. සිංහල බෞද්ධයන් අද දියුණු වී නොව පරිහානියට පත් වී ඇත. ඒ වෙනස්වීම තරමකින් හෝ සාකච්ඡාකිරීමට පෙර එක්තරා ප්‍රශ්නයකට පිළිතුරු දිය යුතු වෙයි. ඒ ප්‍රශ්නය නම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට මුහුණ දී ඒ පරාජයකිරීමට සිංහල බෞද්ධ සංස්කෘතියට නොහැකි වූයේ මන්ද යන්න ය. එසේ පරාජයකිරීමට නොහැකිවීම ම පෙන්නුම්කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති දුර්වල කම ද?

අද වන විට සිංහල බෞද්ධ සංස්කෘතිය පරාජය වෙමින් පවතින බව පිළිගත යුතු ය. එහෙත් තවමත් ඒ මුළුමනින් පරාජය වී නැත. කෙසේ වුවත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා සිංහල බෞද්ධ සංස්කෘතිය අතර වන තරගයෙන් සිංහල බෞද්ධ සංස්කෘතිය පරාජය ලබමින් සිටින්නේ ඇයි? මෙහි දී අපට පැහැදිලිව පෙනෙන සාධකය නම් පෘතුගීසීන් පැමින අවුරුදු භාරසිය හැත්තෑ පහක් පමණ වන තෙක් සිංහල බෞද්ධ සංස්කෘතිය ගමෙහි දී පරාජයකිරීමට බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට නොහැකි වූ බව ය. සිංහල බෞද්ධ සංස්කෘතිය ගමේ දී කිසි දිනෙක පරාජය නො වෙයි. එසේ නම් අද කෙරී ඇත්තේ ගම වෙනස්කිරීම ය. ඒ වෙනස්කිරීම ඇරඹුනේ බටහිර

© Prof. Nalin De Silva

නූතනත්වයේ අධ්‍යාපනය ගමට දීමෙන් පසුව ය. හැත්තෑහතේ දී ඊනියා විවෘත ආර්ථිකයක් ඇතිකිරීමට පියවරගැනීමට හැකිවූයේ ඒ වන විට ගමෙහි ආධිපත්‍යය සඟ වෙද ගුරු ත්‍රිත්වයෙන් ඉවත්කර උපාධිධාරී තරුණයාට නාමික ව හෝ ලබාදීමට කටයුතු කෙරී තිබුණු බැවිනි.

පෘතුගීසීන් පැමිණීමෙන් පසුව හඳුන්වාදෙන ලද සංස්කෘතිය ඉන්ද්‍රිය පිනවීම මුල්කරගත් සංස්කෘතියක් විය. එවැනි සංස්කෘතියක් පැතිරී යෑමට ඇති ඉඩකඩ ඉතා අධික ය. එයට හේතුව මිනිසාගේ සිරුරු සකස් වී ඇත්තේ ම ඉන්ද්‍රිය පිනවීම සඳහා වීම ය. මිනිස් මනස ද ඉල්ලා සිටින්නේ මනස පිනවීම ය. ඉන්ද්‍රිය පිනවීම යනු අවසාන වශයෙන් ගත්කල මනස පිනවීමකි. බෞද්ධයනට මනස ද ඉන්ද්‍රියයක් බව අමතක නොකළ යුතු ය. කුඩා දරුවකු වඩා කැමති වන්නේ පැණි රස දෙයක් කෑමට මිස සෞඛ්‍යයට ගුණ බැවින් කරවිල කෑමට නො වෙයි. කුඩා දරුවාට කරවිල කැවිය හැක්කේ එහි ගුණ අවබෝධකරවීමෙන් පමණකි.

එහෙත් පුදුමය ඉන්ද්‍රිය පිනවීමට අනුබල දෙන බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ආසියාතික රටවල එතරම් වේගයකින් පැතිර නො යෑම ය. අවුරුදු හාරසිය පණහකට ආසන්න කාලයක් තිස්සේ බටහිර සංස්කෘතිය ආසියාවේ ගම්වල පැතිර නො ගියේ ය. අප ඒ සාධකය හොඳින් අධ්‍යයනය කළ යුතු ය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හමුවෙහි සිංහල බෞද්ධ සංස්කෘතිය පැරදීමට හේතුව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දුර්වල කමක් යැයි කීමට පෙර කල්පනා කළ යුතුව තිබුණේ සියවස් හතරහමාරක් ඒ සංස්කෘතිය නොපැරදුනේ ඇයි ද යන්න ය. එහි දී පෙනී යන කරුණ නම් බටහිරයන්ට ඒ කාලයෙහි සිංහල බෞද්ධ චින්තනයෙහි (චින්තනයට ආකල්ප ද අයත්වෙයි) වෙනසක් කිරීමට නො හැකිවීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva